

# 16
# අල්කුර්ආනය ගොනු කිරීම

අල්කුර්ආනය පහළ වූ කාලයේ ම එය ගොනු කිරීමේ කටයුතු ආරම්භ විය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ එතුමාට වහී පැමිණි අවස්ථාවල තමා සමග සිටි සගයින්ට පැවසූහ; තමා ද මතනය කර එලෙස ම තම සගයන්ට ද එය මතනය කිරීම සඳහා යොමු කළහ. අල්කුර්ආනය කොටස් වශයෙන් පහළ වීම එය මතනය කිරීමට පහසුවක් විය.

එසේ ම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ තමාට පහළ වූ වාක්‍යයන් ග්‍රන්ථාරූඪ කිරීම සඳහා සමහර සහාබිවරුන් නිල වශයෙන් පත් කළහ. '**කුත්තාබුල් වහී**' (වහී සටහන් කරන්නන්) යන නමින් හැඳින්වූ මොවුහු අල්කුර්ආන් වාක්‍යයන් පහළ වූ විගස ඒවා සටහන් කර ගත්හ. සතුන්ගේ සම්, පළල් වූ ඇටකටු, ගස්වල පොතු යනාදිය ඒවා ලියා තබා ගැනීම සඳහා උපයෝගී කර ගත්හ. මෙසේ පහළ වූ වාක්‍යයන් ඇතුළත් විය යුතු සූරාවන් තිබිය යුතු පිළිවෙළ පිළිබඳ මගපෙන්වීම් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ඔවුනට ලබා දුන්හ. එම පිළිවෙළට ම අද දක්වා ම අල්කුර්ආනය පාරායනා කරනු ලැබේ. එම පිළිවෙළ '**තර්තීබුත් තිලාවත්**' (පාරායනය කරන පිළිවෙළ) යන නමින් හැඳින්වේ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වෙත තමාගේ 40 වන වියේ සිට මක්කාවේ දී හා මදීනාවේ දී වසර 23ක පමණ කාලයක් තිස්සේ පහළ වූ අල්කුර්ආන් වාක්‍යයන් එතුමාගේ වෆාතයත් සමඟ ම සමාප්ත විය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ හිජ්රි 11 වන වසරේ වෆාත් වූහ. ඉන්පසු කිලාෆත් වගකීම් භාරගත් අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාගේ සමයේ විවිධ සටන් හටගත්තේ ය. යමාමා යුද්ධයේ දී අල්කුර්ආනය මතනය කළ සහාබිවරු 70ක් පමණ ෂහීද් වූහ. එනිසා ඉතිරි ව සිටින හාෆිල්වරුන් ද ෂහීද් වූවා නම් අල්කුර්ආනය නැතිවී යාවි දෝ යන බිය හස්රත් උමර් රළියල්ලාහු අන්හු තුමාණන්ට ඇති විය.



මෙම කරුණු සම්බන්ධයෙන් කලීෆා අබූබක්කර් රළියල්ලාහු අන්හු තුමාණන් සමඟ උමර් රළියල්ලාහු අන්හු තුමාණෝ සාකච්ඡා කළහ. අවසානයේ දී අල්කුර්ආනය සුරැකීමේ අවශ්‍යතාව වටහා ගත් කලීෆා තුමාණෝ, එය ග්‍රන්ථාරූඪ කිරීමේ ක්‍රියාවලියට අවතීර්ණ විය.

අල්කුර්ආනය ලිවීමට කමිටුවක් පත් කරන ලදී. එම කමිටුව කුත්තාබුල් වහී සාමාජික සෛද් ඉබ්නු සාබිත් රළියල්ලාහු අන්හු තුමා තම නායකයා වශයෙන් තෝරා ගත්තේ ය. තමාට පැවරූ වගකීම අමානතයක් ලෙස සැලකූ සෛද් ඉබ්නු සාබිත් රළියල්ලාහු අන්හු තුමා එය නිසියාකාරව සැලකිලිමත්ව, නිවැරදිව ඉටු කළේ ය.

මෙසේ ගොනු කළ මුල් පිටපත 'මුස්හෆ්' නම් වේ. එය අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා තමා සන්තකව, සුරක්ෂිතව තබා ගත්තේ ය. තම අවසාන කාලයේ දී එය උමර් රළියල්ලාහු අන්හු තුමාණන්ට භාර දුන්නේ ය. එතුමාගෙන් පසු ව හෆ්සා රළියල්ලාහු අන්හා තුමිය සතුව එය ආරක්ෂා සහිතව තබා තිබුණි.

කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමාගේ පාලන සමයේ දී අරාබි අර්ධද්වීපයෙන් පිටත ද ඉස්ලාම් ධර්මය පැතිරෙන්නට විය. කලීෆා උස්මාන් රළියල්ලාහු අන්හු තුමාගේ පාලන කාලයේ දී මෙය තවත් ව්‍යාප්ත විය. මව් බස අරාබි නොවූ අය ද ඉස්ලාම් ධර්මයට පිවිසුණහ.

මෙම කාල පරිච්ඡේදයේ ආර්මේනියා - ආසර්බයිජාන් ප්‍රදේශයේ සටනක් ඇති විය. මෙයට සහභාගි වූ මුස්ලිම් සේනාවට අයත් ඉරාකය, සිරියාව යනාදී රටවල වීරයෝ තමන්ගේ භාෂාවෙන් ම අල්කුර්ආනය පාරායනය කර එය ම නිවැරදි යැයි වාද කර ගන්නට වූහ.

මෙය දැනගත් හුදෛෆා ඉබ්නු යමාන් රළියල්ලාහු අන්හු නමැති නබි සහාබිවරයෙක් මේ බව කලීෆා තුමාට පැමිණිලි කර අල්කුර්ආනය පාරායනය කිරීමේ දී මුස්ලිම්වරුන් භේද නොවී ආරක්ෂා කිරීමේ වැදගත්කම අවධාරණය කළේ ය.

එය පිළිගත් කලීෆා උස්මාන් රළියල්ලාහු අන්හු තුමා වහා ක්‍රියාත්මක වී එම කටයුතු ඉටු කිරීමට කණ්ඩායමක් පත් කළේ ය. එම කණ්ඩායමට සෛද් ඉබ්නු සාබිත් රළියල්ලාහු අන්හු තුමා ව නායකයා වශයෙන් නැවත පත් කරනු ලැබිණි. මෙම කණ්ඩායම හෆ්සා රළියල්ලාහු අන්හා තුමිය සතුව සුරක්ෂිතව තිබූ අල්කුර්ආනයේ මුල්පිටපත රැගෙන පරීක්ෂා



පෞරාණික කුර්ආන් හි පිටුවක දර්ශනය

කර එහි පිටපත් ගණනාවක් ලියූහ. මෙලෙස ලියූ පිටපත් ප්‍රධාන නගරවලට යවන ලදී. එසේ ම කුරෛෂිවරුන්ගේ භාෂා විලාසයෙන් පාරායනය කිරීමට දක්ෂ හාෆිල්වරු හා කාරිවරු ද යවන ලදහ. භාෂා විලාසයෙන් වෙනස් වූ පිටපත් එක් රැස් කර ඒවා විනාශ කරන ලදී. මෙයින් අල්කර්ආනයේ ඒකීයත්වය ආරක්ෂා විය. එමනිසා උස්මාන් රළියල්ලාහු අන්හු තුමාණන් '**ජාමිඋල් කුර්ආන්**' (අල්කුර්අනය මගින් මුස්ලිම්වරුන් එක්සේසත් කළ තැනැත්තා) යැයි හඳුන්වනු ලැබේ. මෙලෙස ගොනු කළ පිටපත් '**මුස්හෆ් උස්මානි**' නමින් හැඳින් වේ. වර්තමානයේ භාවිතයේ පවතින්නේ මෙම පිටපත් ය.

අල්කුර්ආනය කිසි දු වෙනසක් නොවී සහාබාවරුන්ගේ කාලයේ ම ග්‍රන්ථාරූඪ කර සුරක්ෂිත විය. කුරෛෂිවරුන්ගේ භාෂා විලාසයෙන් අල්කුර්ආනය පහළ වූ නිසා එම භාෂා විලාසයෙන් ම ලියන ලදී. පසුගිය කාලපරිච්ඡේදයේ පමණක් නොව අවසාන දිනය දක්වා එය ආරක්ෂා කරන බව අල්ලාහුතආලා පවසා ඇත්තේ ය. පහත සඳහන් අල්කුර්ආන් වැකිය එය තහවුරු කරන්නේ ය.



**අභ්‍යාස**

(අ) කොටස (ආ) කොටස සමඟ යා කරන්න.

| (අ) | (ආ) |
| --- | --- |
| 1. අල්කුර්ආනය පාරායනය කරන පිළිවෙළ | 1. කුත්තාබුල් වහී |
| 2. අල්කුර්ආනය ගොනු කිරීමට පත් කළ කණ්ඩායමේ නායකයා | 2. ගස්වල පොතු, ඇටකටු |
| 3. කලීෆා උස්මාන් රළියල්ලාහු අන්හු තුමාගේ පාලන සමයේ ඇති වූ යුද්ධය | 3. තර්තීබුත් තිලාවත් |
| 4. කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමාගේ වෆාතයට පසුව මුල් පිටපත ආරක්ෂිත ව තබා ගත් අය. | 4. යමාමා යුද්ධය |
| 5. මුල් කාලයේ දී වහී ලිවීමට උපයෝගී කරගත් දේවල් | 5. උමර් රළියල්ලාහු අන්හු |
| 6. කලීෆා අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාගේ කාලයේ දී හාෆිල්වරු වැඩිදෙනෙක් ෂහීද් වූ සටන | 6. සෙයිද් බින් සාබිත් රළියල්ලාහු අන්හු තුමා |
| 7. කලීෆා උස්මාන් රළියල්ලාහු අන්හු තුමාගේ විශේෂ නාමය | 7. මුස්හෆ් |
| 8. අල්කුර්ආනය එක් රැස් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කලීෆා අබූක්ර් රළියල්ලාහු අන්හු තුමාට උපදෙස් දුන් පුද්ගලයා | 8. හෆ්සා රළියල්ලාහු අන්හා තුමිය |
| 9. අල්කුර්ආනයේ මුල් පිටපත | 9. ආර්මීනියා යුද්ධය |
| 10. වහී ලියන්නෝ | 10. ජාමිඋල් කුර්ආන් |